## පෙනී නොසිටීම සඳහා වූ අවසරයක් මත සිටින විට ඔබගේ අයතිවාසිකම් පිළිබඳ තොරතුරු දැන්වීම

**මෙම පත්‍රිකාව තේරුම් ගැනීමට හෝ ප්‍රතිකාර සම්බන්ධයෙන් ඔබට උදව් අවශ්‍යවන්නේ නම් කරුණාකර ඕනෑම විටකදී කාර්‍යමණ්ඩලයෙන් විමසන්න.**

## පෙනී නොසිටීම සඳහා වූ අවසරයක් යනු කුමක්ද?

නේවාසික රෝගීන් සඳහා ප්‍රතිකාරකරන  නියෝගයක් යනු මානසික රෝගයකින් පෙළෙන අයෙකුට තම ප්‍රතිකාර සම්බන්ධයෙන් එකඟවීමට නොහැකි සහ එසේ කිරීම ආරක්ෂාකාරී නොවන විටකදී  නීත්‍යානුකූළ ආකාරයකින් එම ප්‍රතිකාර ලබාදීම වේ.

පෙනී නොසිටීම සඳහා වූ අවසරයක් යනු රෝගියෙකු යම් කොන්දේසි වලට යටත්ව අනුමත යම් කාළයක් සඳහා ප්‍රතිකාර මධ්‍යස්ථානයෙන් බැහැරව සිටීමයි.

## මම පෙනී නොසිටීම සඳහා වූ අවසරයක් මත සිටින්නේය යනුවෙන් තේරුම් යන්නේ කුමක්ද?

ඔබ නේවාසික රෝගීන් සඳහා ප්‍රතිකාරකරන  නියෝගයක් මත සිටින්නේ නම් ඔබගේ මානසික රෝගීතාවය උදෙසා ප්‍රතිකාර මධ්‍යස්ථානයක නැවතී සිටිමින් නියමිත ප්‍රතිකාර ලැබිය යුතුය.

මේ ප්‍රතිකර්ම අතර සාබච්ඡා මාර්ගයෙන් දෙනු ලබන පිළියම්, බෙහෙත් සහ වෙනත් මැදිහත් වීම් ඇතුලත්වේ.

ප්‍රතිකර්ම දෙනු ලබන්නේ පුහුණු වෛද්‍ය වෘත්තිකයන් වන අතර ඒ අතරට වෛද්‍යවරුන්, හෙදියන්, වෘත්තීමය පිළියම්කරුවන්, සමාජසේවකයන් සහ මනෝවෛද්‍යවරුන් ඇතුලත්වේ. මෙම වෘත්තිකයන් ඔබ සමඟ ක්‍රියාකරමින් සුවසීම උදෙසා ඔබට උදව්වනු ඇත.

යම් විශේෂිතවූ කාළසීමාවක් සඳහා ප්‍රතිකාර මධ්‍යස්ථානයෙන් බැහැරවීමට හැකිවනසේ ප්‍රතිකාර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකතුමා විසින් පෙනී නොසිටීම සඳහාවූ අවසරයක් දියහැකිය.

පෙනී නොසිටීම සඳහාවූ අවසරය සම්බන්ධයෙන් ඔබට ඇති ඕනෑම ප්‍රශ්ණයක් කාර්‍යමංඩලයෙන් විමසන්න.

ප්‍රතිකාර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකතුමා විසින් ඔබේ පෙනී නොසිටීම සඳහාවූ අවසරය අවලංගු කළ හැකිය. මේ පිළිබඳව කාර්‍යමංඩලය හැකිවිගස ඔබට දැනුම්දෙනු ලබන අතර ඔබ වෙනත් ස්ථානයක සිටින්නේ නම් නැවත ප්‍රතිකාර මධ්‍යස්ථානයට පැමිණීමට උදව් කරනු ඇත.

අධ්‍යක්ෂකතුමා විසින් ඔබට ප්‍රතිකාර මධ්‍යස්ථානයේ පෙනී නොසිටීම සඳහාවූ අවසරයට කොන්දේසි දැමිය හැකිය. එසේ කොන්දේසි දැමීම මගින් ඔබේ ආරක්ෂාව හා විධිමත් ප්‍රතිකාර දීම තහවරු වන අතර යම් සීමාවන් පැනවීම හෝ නොකරහැරීම් ඇතුලත් විය හැකිය.

ඒ නොකර හැරීම් අතරට:

> යම් ස්ථානයක් සඳහා යෑම.
> යම් පුද්ගලයන් බැහැ දැකීම.
> යම් ක්‍රියාකාරකම් වල නිරතවීම.
> මත්පැන් පානය හෝ මත්ද්‍රව්‍ය භාවිතා කිරීම.

පෙනී නොසිටීම සඳහාවූ අවසරයට දමන ලද ඕනෑම කොන්දේසියකට බාහිරව ඔබේ කැමැත්ත පරිදි ඕනෑම දෙයක් කළහැක.

එසේම පෙනී නොසිටීම සඳහාවූ අවසරයට දමන ලද කොන්දේසි වලට අමතරව ඔබේ ප්‍රතිකාර හා සුවතා සටහන පිළිපැදීමට දිරිගැන්වීම කරනු ලබන අතර සුවවීම උදෙසා අසුබවාදී බලපෑමක් ඇතිවන ක්‍රියාවල නියුක්ත නොවිය යුතුය. මේ පිළිබඳව වැඩිදුර තොරතුරු අවශ්‍ය නම් කරුණාකර ඔබේ ප්‍රතිකර්ම කණ්ඩායමෙන් විමසන්න.

ඔබට පෙනී නොසිටීම සඳහාවූ අවසරයට දී ඇති කොන්දේසි වලට අවනතවීමට අමතරව අධ්‍යක්ෂකවරයා නියම කරනුලබන කාළයට ප්‍රතිකර්ම මධ්‍යස්ථානයට නැවත පැමිණිය යුතුය.

## පෙනී නොසිටීම සඳහා වූ අවසරයක් මත සිටින විට මගේ අයිතිවාසිකම් මොනවාද?

ඔබේ ප්‍රතිකාර සම්බන්ධයෙන් සතුටු නොවන්නේ නම් ප්‍රතිකාර කණ්ඩායම සමග සාකච්ඡා කළ හැක. ඔබ බලාපොරොත්තු වන පරිදි ප්‍රතිකාර වලින් ඇතිවන සුවය පිළිබඳ ඔබ සෑහීමකට පත් නොවන්නේ නම් ඒ සඳහා විධිමත් පැමිනිල්ලක් කළහැක. ඒ සඳහා ඔබට උපකාර වන දුරකථන අංක මෙම පත්‍රිකාවේ සඳහන්ව ඇත.

ඔබ පිළිබඳ තොරතරු රහසිගත වනමුත් නීතියෙන් හෙළිදරව් කිරීමට අවශ්‍යවන්නාවූ හෝ සේවාවක් සැපයීම සඳහා හෝ සුරක්ෂිතභාවය පවත්වාගෙන යාම සඳහා හෙළිදරව් කළහැක. තරදුරටත් මෙකී තොරතුරු ඔබේ සුබසිද්ධිය උදෙසා හා ප්‍රතිකාර කරන විට හා ඔබේ සුවයට සාධාරණ ලෙස අවශ්‍ය වන්නේ නම් වෙනත් ආයතන සමග හෝ ඥාතියකු සමග හෝ සාත්තුසේවකයකු හෝ මිතුරෙකු සමග බෙදා ගතහැක.

## ප්‍රතිකාර මධ්‍යස්ථානයට නැවත මම නොපැමිණියහොත් කුමක් සිදුවේද?

අධ්‍යක්ෂකතුමා විසින් නියම කළ කාළයට ඔබ නැවත ප්‍රතිකාර මධ්‍යස්ථානයට නොපැමිණියොත් ඔබ නියෝගය කඩ කරනු ලබයි.  සේවකමණ්ඩලය ඔබ නැවත පැමිණීම තහවුරු කිරීමට කටයුතු කරනු ලබයි. ඔබේ මානසික රෝගයට දිගටම ප්‍රතිකාර ගැනීම හා සුරක්ෂිතව සිටීම වැදගත්වේ.

## නීති සහය

මානසික සෞඛ්‍ය ක්‍රියාවලිය තේරුම් ගැනීම සඳහා සමහරවිට ඔබට හෝ ඔබගේ පවුලේ අයට උපකාර අවශ්‍ය විය හැක.

### Peer Worker (සමසේ වැඩකරන්නා)

ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ඔබට සහය දීමට හැකි සමසේ වැඩකරන්නවුන් හෝ සම විශේෂඥයන් සිටිය හැක. කරුණාකර සේවක මන්ඩලයෙන් වැඩිදුර විස්තර විමසන්න. සාත්තුකරුවන්ට සහ පවුල්වලට උදව්කිරීමට සත්කාර පිළිබඳ උපදේශකයකුද සිටිය හැක.

### Community Visitor Scheme

**ප්‍රජාවට පැමිණීමේ වැඩ සටහන** ස්වාධීන ව්‍යවස්ථානුතුල ආයතනයක් වන අතර අනුමතකරන ලද පත්‍රිකාර මධ්‍යස්ථාන නිරීක්ෂණය කිරීමද එහි මානසික ප්‍රතිකාර සුවය ලබන්නවුන්ගේ අයිතිවාසිකම් සඳහා නීති සහයද ලබාදේ

දුරක: 08 7425 7802 ගාස්තු රහිත: 1800 606 302

### The Office of the Public Advocate

**පොදු නීතිවේදීන්ගේ කාර්යාලය** මානසික දුබලතාවය සහිත පුද්ගලයන්ට උපදෙස්දීම, සහයවීම සහ නීති සහය සඳහා වූ ස්වාධීන ආයතනයකි.

දුරක: 08 8342 8200 ගාස්තු රහිත: 1800 066 969

### The Disability Advocacy and Complaints Service of South Australia

**දකුණු ඔස්ට්‍රේලියාවේ විකලාංගභාවය සඳහාවූ නීතිඋපදෙස් හා පැමිණිලි සේවාව** රාජ්‍ය නොවන සංවිධානයක් වන අතර ඕනෑම විකලාංගභාවයකින් පෙලෙන්නන් සඳහා නීතිඋපදෙස් හා පැමිණිලි සඳහා සහය වේ.

දුරක: 08 8297 3500 ග්‍රාමීය ප්‍රදේශ සඳහා ගාස්තු රහිත: 1800 088 325

**MALSSA** රාජ්‍ය නොවන සංවිධානයක් වන අතර විශේෂයෙන් ඉංග්‍රීසි කථා කල නොහැකි සහ සංස්කෘතිමය සහ භාෂාමය වශයෙන් විවිධවූ පසුබිමක් ඇත්තවුන්ට මානසික සෞඛ්‍ය ක්‍රියාදාමය පිළිබඳව තම සේවාදායකයන්ට නීති සහය ලබාදේ.

දුරක: 08 8351 9500

## භාෂා සහය

**භාෂා සහ භාෂණ පරිවර්ථන මධ්‍යස්ථානය**

දුරක: 08 8226 1990 (දකුණු ඔස්ට්‍රේලියාව)

**භාෂා සහ භාෂණ පරිවර්ථන සේවාව**

දුරක: 131 450 (ජාතික)

**ජාතික ආදේශක සේවාව**

ඇසීමේ හා කථා කිරීමේ අපහසුතා ඇති පුද්ගලයින් සඳහා

දුරක: 133 677

ගාස්තු රහිත: 1800 555 677

## පැමිණිලි

**ප්‍රතිකාර මධ්‍යස්ථාන** වල විමසීම් හා පැමිණිලි වලට සහය වීමට නිළධාරීන් ඇත. කරුණාකර නිවැරදි පුද්ගලයා ඔබට මුණගැස්වීම සඳහා කාර්යමණ්ඩලයේ සහය පතන්න.

**ප්‍රධාන මනෝවිකිත්සකයා** සුරක්ෂිත හා කාර්යක්ෂම මානසික සෞඛ්‍ය සේවාවක් සඳහා සහතික වේ.

දුරක: 08 8226 1091

**සෞඛ්‍ය හා ප්‍රජා සේවාවන්ගේ පැමිණලි සඳහා වූ කොමසාරිස්** පැමිණිලි විසඳීම සඳහා උදව්වේ.

දුරක: 08 8226 8666

ගාස්තු රහිත: 1800 232 007

© Department of Health and Ageing, Government of South Australia. All rights reserved. Printed June 2012

Government of South Australia
SA Health

# අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය

# Leave of absence

## (පෙනී නොසිටීම සඳහා වූ අවසරය)

ප්‍රධාන මනෝවිකිත්සක කාර්යාලය

SINHALA

Government of South Australia
SA Health